

කොහොම වුනත් ගෝලියකරණ ක්‍රියාවලිය නතර කල හැකි එකක් නෙවෙයි. මුළු මහත් ඉතිහාසය පුරා ලෝකයත්, එහි සිටින මිනිස් සමාජයත් වඩ වඩා සමීප සම්බන්ධතාවලින් තුලින් එකිනෙකට සමීප වෙමින් තිබෙනවා. හැබැයි ධනේශ්වර ක්‍රමය මෙම ක්‍රියාවලිය විකෘතියට පත් කර තිබෙනවා. ධනේශ්වර ගෝලියකරණයේ සෙල්ලම් පිටිය තුල කිසිවකුත් සාමාන්‍යයින් හැටියට සෙල්ලම් කරන්න අවස්ථාවක් ලැබෙන්නෙ නැහැ.

- ලයනල් බෝපගේ -

ලෝකය පුරාමත් ලංකාවේත් වර්තමාන තත්වය ඉතාමත් සංකීර්නයි. ගෝලීයකරනය නොවැලැක්විය හැකි ලෙස ලොව පුරා පැතිර යමින් පවතිනවා. එම ක්‍රියාවලිය තුල වර්ධනය වන ප්‍රති විරෝධී ප්‍රශ්න දෙකක් පේන්න තියෙනවා. එක අතකින් එහි අනිවාර්ය ප්‍රතිඵලයක් හැටියට නිශ්පාදකත්වය වැඩිදියුණු කරමින්, ජගත් ධනවාදී තරඟකාරීත්වය ඉහළ තලයකට නංවමින්, නිශ්පාදන ක්‍රියාවලිය හැකි තරම් යාන්ත්‍රිකරනය සහ ස්වයංක්‍රීය කිරීම තුලින් නිර්-මානුෂික කරමින්, බහු ජාතික සමාග ම්වලට ලාභ උපරිමකරණය කරන්නට මග සලස්වයි. යෝධ ධනේෂ්වර ඒකාධිකරණය විසින් මුළු මහත් පොළෝ තලයම, එහි ස්වභාවික හා මානව සම්පත් සියල්ලම, ආර්ථික, රාජ්‍ය, දේශපාලනය, සංස්කෘතිය, දෘෂ්ටිය වැනි ප්‍රපංච සියල්ලක්ම සිය ග්‍රහනයට හසුකර ගනිමින් සිටිනවා. සකලවිද මහද්වීපයනුත්, සප්ත මහා සාගරයත්, වායු ගෝලයත්, අභ්‍යවකාශයත් ආදී සියල්ලම මෙම ග්‍රහනයට නතු කර ගනිමිනුයි තිබෙන්නේ. අනෙක් අතට මෙම ක්‍රියාවලිය තුලින් ඇති වී තිබෙන ප්‍රතිවිරුද්ධ ප්‍රතිඵලය නම් ලොව පුරාම විවිධ රටවල් අතරින් එක් එක් රටක් ඇතුලෙත් ඇති නැති පරතරය වැඩි වෙමින් පැවතීමයි. ආර්ථික වර්ධන වේගය කෙතරම් වුනත් ගෝලීයකරණයේ ඇති වී තිබෙන ආර්ථික සංවර්ධනයේ ප්‍රතිඵල ගොනු කරගනු ලබන්නේ සමාජයේ අතලොස්සක් විසින් පමණක් බව වහාම පසක් වී තිබෙනවා. ධනවාදයේ ගෝලීයකරණය තුලින් ක්‍රියාත්මක වන නව ලිබරල්වාදී ආර්ථික ක්‍රමය සහ ඒ හා සම්බන්ධ වැඩ පිළිවෙල හොඳින් හෝ නරකින්, සාමයන් හෝ යුද්ධයෙන් විවෘත ලෙස හෝ ආවෘත ලෙස ලොව පුරාම පතුරුවා ලන්නට නව ලිබරල්වාදී බලවේග උත්සුක වී සිටිනවා.

කොහොම වුනත් ගෝලියකරණ ක්‍රියාවලිය නතර කල හැකි එකක් නෙවෙයි. මුළු මහත් ඉතිහාසය පුරා ලෝකයත්, එහි සිටින මිනිස් සමාජයත් වඩ වඩා සමීප සම්බන්ධතාවලින් තුලින් එකිනෙකට සමීප වෙමින් තිබෙනවා. හැබැයි ධනේශ්වර ක්‍රමය මෙම ක්‍රියාවලිය විකෘතියට පත් කර තිබෙනවා. ධනේශ්වර ගෝලියකරණයේ සෙල්ලම් පිටිය තුල කිසිවකුත් සාමාන්‍යයින් හැටියට සෙල්ලම් කරන්න අවස්ථාවක් ලැබෙන්නෙ නැහැ. එහෙම වෙලා තියෙන්නෙ ඇතියවුන් විසින් ඒකාධිකාරී ලෙස ඇති කරගෙන තිබෙන තාක්ෂණ හා බුද්ධිමය දේපල නිසා සහ නැතියවුන්ට තාක්ෂණ හා බුද්ධිමය හැකියාවන් ලබා ගැනීමට තිබෙන අවකාශ කපා හැරීම නිසා.

මෙවැනි තත්වයක් තුල ලංකාව වගේ රටවල්වලට තිබෙන අනාගත ක්‍රියාමාර්ගය මොන වගේ එකක්ද කියන ප්‍රශ්නය වැදගත් වෙනවා. එවැනි ප්‍රවේශයකට එන්න ඉස්සරවෙලා තවත් කාරනයක් පැහැදිලි කල යුතුයි. පිරිසිදු න්‍යායන් ලෙස ගත්තොත් ධනවාදයටත්, සමාජවාදයටත් ලෝකයේ අතිමහත් ජන කොටසකගේ ප්‍රශ්න වලට විසඳුම් සපයන්න බැරි වී තිබෙනවා. එහෙම වෙන්න හේතු දීර්ඝ ලෙස විස්තර කරන්න යන්නේ නැහැ මේ අති මහත් ජන කොටස් මුහුණ දෙන ප්‍රශ්න විවිධාකාර උනත් ඔවුන්ට පොදු ප්‍රශ්න තිබෙනවා. ආසියාවේ, අප්‍රිකාවේ, ලතින් ඇමරිකාවේ බොහෝ ජන කොටස්වලටත්, අනෙක් රටවල ඇතැම් ජන කොටස් අතරත් තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක් තමයි ඔවුන්ගේ ජීවිත වල මූලික අවශ්‍යතා සපුරා ගන්නට ඉඩකඩ නොමැතිකමේ ප්‍රශ්ණය; ඒ කියන්නේ කුසගින්න නිවාගන්න ආහාර වේලක්, ලෙඩ දුකින් පෙලෙන්නේ නැතිව දිවි ගෙවන්න පිළිවෙලක්. විලි වහ ගන්න වස්ත්‍රයක් සහ පවුලේ අයට ආවරනය වී සිටින්නට වහලයක් ආදිය සපයා ගන්න එක. න්‍යාය කතා කර කර ඉන්නවට වඩා සමාජ භාවිතාව තුලින් ඉගෙන ගන්න බොහෝ දේවල් තිබෙනවා යයි මම කල්පනා කරනවා. ධනවාදී වේවා, සමාජවාදී වේවා, ලෝකයේ අනෙක් රටවල් මෙම තත්වය තුල මේ ප්‍රශ්නවලට මුහුණ දුන්නු ආකාරය සහ මුහුණ දෙන ආකාරය මේ නිසා ඉතා වැදගත් වෙනවා.

නව ලිබරල් වාදය ගෝලියකරණය ගැන, බාදාවන්ගෙන් තොර නිදහස් වෙලඳාමක් ගැන කොපමන කතා කරත්,එම නව ලිබරල් වාදී වැඩපිළිවෙලක් තුල ගොඩ නැගුනු ආදර්ශයට ගතහැකි රටක් ලෝකයේ කොහේවත් නැහැ. ඇමරිකාව ගත්තත්, ජපානය ගත්තත්,යුරෝපය ගත්තත්, ඔස්ට්‍රේලියාව ගත්තත් තත්වය එකයි.

- ලබන කලාපයෙන් හමුවෙමු -

# දිවයින දිනපතා පත්‍රයේ කර්තෘගෙන් ආයාචනයක්

ශ්‍රී ලංකාවේ ඉතාමත් ජනප්‍රිය දිනපතා පුවත් පතක් වන දිවයින දිනපතා පත්‍රයේ ප්‍රධාන කර්තෘ මෙරිල් පෙරේරා මහතා වසර දෙකකටත් වැඩි කාලයක සිට බරපතල ස්නායු ආබාධයකින් පෙළෙමින් සිටී විවිධ ප්‍රතිකාර වලින් පසුව 2007 වසරේ නොවැම්බර් මාසයේදී කොළඹදී සැත්කමක් කරන ලද නමුත් එයින්ද සාර්ථක ප්‍රතිපල අත් නොවිණ දිනෙන් දින ඔහුගේ පාද වල ආබාධ දරුණු වෙමින් පවතින අතර ජීවිතය ඉතාමත් කටුක වී තිබේ එහෙත් ජීවත් වීමට ක්‍රමයක් නැති නිසා ඔහු ඉතා අමාරුවෙන් දිනපතා රැකියාවටද පැමිණෙයි මේ අතර සිංගප්පූරුවේ මවුන්ට් එලිසබෙත් ස්නායු රෝහලේ ලෝක ප්‍රකට වෛද්‍ය විශේෂඥ ප්‍රේම් පිල්ලේ මහතා ඔහු සුවපත් කළ හැකි බව දන්වා තිබේ එහෙත් දින 10 ක ප්‍රතිකාර සඳහා ශ්‍රී ලංකා මුදලින් රුපියල් ලක්ෂ 35 ක් පමණ අවශ්‍යව තිබේ මෙරිල් පෙරේරා මහතාට රැකියාවට අමතරව වෙනත් ආදායම් මාර්ගයක් නොමැති හෙයින්



මේ සඳහා ශ්‍රී ලාංකික සහ විදේශ-කයන්ගේද සමිති සමාගම් මගින්ද ආධරයක් බලාපොරොත්තු වේ එම ආධාර මුදල් මෙරරිල් පෙරේරා නමින් කොළඹ 14 ග්‍රෑන්ඩ්පාස්හි සෙලාන් බැංකුවේ අංක 241308 දරණ ගිණුමට බැර කළ හැකිය

ඔහුගේ ජංගම දුරකථ අංකය 0777701009
විද්‍යුත් තැපෑල - webmaster@unl.upali.lk

## අවමංගල ස්තූතිය



2008 මාර්තු 23 වන දින උපුල් රුවන් පෙරේරා මහතා අප අතරින් හදිසියේ වියෝ වූ දින සිට සත්දින දානමය පිංකම දක්වා සියලු කටයුතු වගකීමෙන් යුතුව සාර්ථක අයුරින් නිම කළ ශ්‍රී ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේ සොයුරන් හා ඔවුන්ගෙ ' පවුල් වල සැමට අපගේ හෘද්‍යාංග ම ස්තූතිය පුද කරන අතර එමෙන්ම මේ සඳහා සඳහා සහාය දැක්වූ බර්ට්‍රම් රසල් අවමංගල්‍ය ආයතනයේ කාර්ය මණ්ඩලයටද, එසෙක්ස් හයිට්ස් (Essex Hights Primary School) ප්‍රාථමික පාසලේ ගුරු භවතුන් සහ මාපිය සංගමයට, ආගමික කටයුතු කළ මහා සංඝ රත්නයට, නන් අයුරින් උදව් උපකාර කළ, ශෝක ප්‍රකාශන පල කළ සහ සහභාගී වූ සියලු දෙනාටම අප පවුලේ කෘතඥපූර්වක ස්තූතිය පිරිනමමු.

- උපුල් රුවන් පෙරේරාගේ පවුලේ සැම -

## මානවඩුගේ මාසය

